ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>ඉන්දීය, මාලදිවයින් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවන් අතර ත්‍රෛපාර්ශවික සාකච්ඡාමය අභ්‍යාසයක්</u>**

ඉන්දීය, මාලදිවයින් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවන් අතර ත්‍රෛපාර්ශවික සාකාච්ඡාමය අභ්‍යාසයක් (Trilateral Table Top Exercise - TTX) 2021 ජූලි 14-15 යන දෙදින අතත්‍ය ආකාරයෙන් පැවැත්විණ. ඉන්දීය නාවික හමුදාවේ බටහිර නාවික විධානයේ CSO (Ops) රියර් අද්මිරාල් ගුර්චරන් සිං, ශ්‍රී ලංකා නාවික හමුදාවේ මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් රියර් අද්මිරාල් පී . එස්. මහාවිතාන සහ මාලදිවයින් ජාතික ආරක්ෂක බලකායේ කර්නල් හිල්මි යන මහත්වරු ජූලි 14 වන දින පැවති TTX – 2021 සමාරම්භක සැසිය සඳහා සහභාගී වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර වූහ . මෙම සාකච්ඡාමය අභ්‍යාසය මුම්බායි හි Maritime Warfare Centre විසින් සම්බන්ධීකරණය කෙරිණ.

TTX – 2021 හි අරමුණ වන්නේ අන්‍යෝන්‍ය අවබෝධය ඉහළ නංවා ගැනීම සහ මත්ද්‍රව්‍ය ජාවාරම් වැනි දේශසීමා හරහා සිදුවන සමුද්‍රීය අපරාධ මැඩ පැවැත්වීමට සහ කලාපය තුළ සමුද්‍රීය සෙවීම් සහ බේරාගැනීම් සඳහා සහයෝගය ලබා දීම වැනි දැට අදාළ මනා පිළිවෙත්/ක්‍රියාමාර්ග හුවමාරු කරගැනීමයි. MV එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධයෙන් සාගර් ආරක්ෂා මෙහෙයුම 2 සාර්ථකව ක්‍රියාත්මක කිරීම යන සන්දර්භය තුළ මෙම අභ් යාසයෙහි අදාළත්වය වඩාත් ඉස්මතු වී ඇත. නාවික හමුදාවන් අතර ශක්තිමත් සහයෝගීතාවය සම්මත මෙහෙයුම් ක්‍රියාදාමයන් ඉදිරියට ගෙන යාම සඳහා පවත්වන ලද TTX වැනි අඛණ්ඩ අන්තර් ක්‍රියාකාරකම්හි ප්‍රතිඵලයක් වේ.

TTX – 2021 අභ්‍යාසය ඉන්දියාව, මාලදිවයින සහ ශ්‍රී ලංකාව අතර පසුගිය වසර කිහිපය පුරා සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ දැඩි ලෙස ශක්තිමත් වී ඇති ගැඹුරු ත්‍රෛපාර්ශවික සබැඳියාව පිළිඹිබු කරයි. ඉන්දියානු සාගර කලාපයේ මෙම අසල්වාසී රටවල් ත්‍රිත්වය අතර අන්තර් ක්‍රියාකාරීත්වය ද ඉන්දියාවේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය සහ "කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය" (SAGAR) යන දැක්ම හා සුසංයෝගීව සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

පසුගිය වසරේ නොවැම්බර් මාසයේ කොළඹ දී පැවති සිව්වන ජාතික ආරක්ෂක උපදේශක මට්ටමේ ත්‍රෛපාර්ශවික හමුවේදී ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මාලදිවයින ඉන්දියානු සාගර කලාපය තුළ සමුද්‍රීය ආරක්ෂාව ඉහළ නැංවිය හැකි ආකාර පිළිබඳව අවධානය යොමු කිරීමට එකඟ විය. ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක අජිත් දොවාල්, ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න සහ මාලදිවයිනේ ආරක්ෂක අමාත්‍ය මරියා දිදි යන මහත්ම මහත්මීහු මේ සඳහා සහභාගී වූහ. සී ෂෙල්ස් සහ මොරිෂස් යන රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරිහු ද අතත්‍ය අයුරින් මේ සඳහා සහභාගී වූහ.

*****

*2021 ජූලි 15*

*කොළඹ*